**ආණමඩුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි උසාවි දඩ රු.700,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | විගණනය විසින් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු ජර්නල් සටහන් මගින්, 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) | කර්මාන්ත ණයහිමි ශේෂ 12ක වටිනාකම රු.3,723,858ක් වැඩියෙන් දැක්වීම නිසා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. | ගිණුම් නිවැරදි කර ණයහිමි ලේඛනය නිවැරදි කළ යුතු වේ. | විගණනය විසින් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු ජර්නල් සටහන් මගින්, 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (iii) | කර්මාන්ත ණයගැති ශේෂ 05ක එකතුව රු.694,365ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කර ණයගැති ලේඛනය නිවැරදි කළයුතු වේ. | විගණනය විසින් පෙන්වා දී ඇති ගිණුම්කරණ අඩුපාඩු ජර්නල් සටහන් මගින්, 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.3,408,834ක් වූ ශේෂ 05ක් හඳුනා ගැනීමකින් තොරව අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණි. | හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම ශේෂ හඳුනාගත නොහැකි බැවින් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.22,451,725ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ශේෂය රු.5,004,121ක් විය. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 ජූනි මාසය වන විට අයකර නොගත් ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.23,428,995ක් වූ අතර ඒ අතරින් වසර 03 ඉක්මවූ ශේෂය රු.1,129,727ක් විය. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 ජූනි මාසය වන විට ගෙවීමට ඇති ඉතිරි මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.88,953,274ක් වූ ගිණුම් විෂයයන් 03කට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවසාන ගිණුම් සමග ගිණුම් ශේෂ තහවුරු කෙරෙන උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණනය විසින් පෙන්වාදී ඇති ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ හා ලීබඩු හා සවිකිරීම් සම්බන්ධ උපලේඛන මේ වන විට සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 128 ඡේදය | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන දේපළ 16ක අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි. | කඩිනමින් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | විධිමත් පරිදි පවරා ගැනීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පැවරීම් කටයුතු සඳහා වන ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,763,164ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,294,563ක් විය

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 5,798 | 4,982 | 4,405 | 8,018 | 5,761 | 3,413 | 2,259 | 7,441 |
| කුලී | 15,546 | 13,466 | 13,199 | 2,292 | 17,698 | 9,017 | 8,831 | 2,025 |
| බලපත්‍ර ගාස්තු | 650 | 874 | 1,153 | - | 525 | 1,278 | 1,278 | - |
| වෙනත් ආදායම් | 18,500 | 30,621 | 16,086 | 22,977 | 14,755 | 15,219 | 19,440 | 8,442 |
| ආදාය | 40,494 | 49,943 | 34,843 | 33,287 | 38,739 | 28,927 | 31,808 | 17,908 |

ම තුල වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂවල හිඟ ආදායම් සමග ලැබිය යුතු සමස්ත වරිපනම් හා බදු ආදායමින් සියයට 35ක්ද, කුලී ආදායමෙන් සියයට 85ක් හා වෙනත් ආදායම්වලින් සියයට 41ක්ද සමාලෝචිත වර්ෂයේදී රැස් කර තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂය තුළ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වර්ෂයේ රු.7,441,032ක් වූ වරිපනම් හා බදු ආදායම්වල හිඟය සමාලෝචිත වර්ෂය අවසානයට රු.8,018,637ක් දක්වා සියයට 08කින් වැඩිවී තිබුණි. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතු වේ. | 2019 වර්ෂය තුළ දේපළ තහනම් කිරීමේ වැඩසටහන් මගින් රු.1,093,869ක් අයකරගෙන ඇති අතර 2019 වර්ෂයේ මුළු රැස්කිරීම රු.4,388,571 දක්වා වර්ධනය කරගෙන ඇති බව දන්වමි. 2020 වර්ෂයේ මාර්තු මාසයේ දේපළ |

| | | |
|---|---|---|
| | | තහනම් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සූදානම් කර තිබුණද පැවති COVID-19 වසංගතය හේතුවෙන් ඒවා සිදු කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී දේපළ තහනම් කිරීමේ වැඩසටහන් සිදු කර හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**2.2.4 කුලී**

-------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| 2019 වර්ෂයට අදාළ හිඟ බදු කුලී රු.1,352,498ක්ද 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ බදු කුලී රු.539,174ක් සහ 2015 වර්ෂයට පෙර සිට හිඟව පවතින රු.28,800ක් වූ කඩ කාමර කුලී අය කරගෙන නොතිබුණි. | හිඟ බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019.12.31 දිනට පැවති හිඟ හිටි බදු කුලීවලින් රු.55,050ක් හා හිඟ හිටි කඩ කුලීවලින් රු.256,100ක් අයකර ගෙන ඇති බව දන්වමි. ඉදිරියේදී මෙම හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**2.2.5**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.6,897,502ක් හා මුද්දර ගාස්තු රු.16,080,249ක් විය. | තවදුරටත් අයවිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ හිටි උසාවි දඩවලින් මේ වන විට රු.2,275,114ක් හා හිඟ හිටි මුද්දර ගාස්තුවලින් මේ වන විට රු.10,584,224ක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදලද කඩිනමින් අයකරගන්නා බව කාරුණිකව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ 2019 දෙසැම්බර් 31 දින වන විට කාරණා 29ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබුණි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සභාවට අදාළ අතුරු ව්‍යවස්ථා වැළඳගත යුතු වේ. | ඉදිරියේදි ඉතිරි අතුරු ව්‍යවස්ථාද අවශ්‍යතාවය අනුව වැළඳ ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**(ආ) වාර්ෂික සංවර්ධන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් ඇස්තමේන්තු මුදල රු.800,000ක් වූ ක්‍රියාකාරකම් 03ක ප්‍රගතිය සියයට 4 සිට 14 දක්වා පරාසයක පැවතුණි. | වාර්ෂික සංවර්ධන සැලැස්මේ සඳහන් කාර්යයන් අප්‍රමාදව ඉටු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සුළු වැඩ කොටස් ඉටු කිරීම නිසා ප්‍රගතිය අඩු මට්ටමක පැවති බව කාරුණිකව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන ඉලක්ක ලෙස බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම, පොදු පහසුකම් සපයාදීම, හඳුනාගෙන තිබුණද එම ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය සියයට 75ට අඩු මට්ටමක පැවතුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | මේ සඳහා විවිධ අනුග්‍රහයන් ලැබුණු හෙයින් මූලා ප්‍රගතිය අඩු වුවද, ඉදිරි වර්ෂය තුල උපරිමය කරා ළඟාවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ ද්වීතියික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 06ක්ද ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 12ක්ද පැවති අතර අනියම්/ආදේශක තනතුරු සඳහා 13 දෙනෙකු අනුමත | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව කාරුණිකව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | කාර්යය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි | | |
| (ආ) | වැඩ තහනමට ලක්වූ සේවකයෙකුගේ රු.2,500ක ණය ශේෂයක් සහ විශ්‍රාම ගිය සේවකයෙකුගේ රු.9,441ක ණය ශේෂයක් 2012 වර්ෂයේ සිට අය නොවී පැවතුණි. | අයවිය යුතු සේවක ණය කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විගණනය විසින් පෙන්වාදී ඇති සේවක ණය 2012 වර්ෂයේ සිට අය නොවී පවතින අතර එම පාර්ශවයන්ට ලිඛිතව ඒ බව දැනුම් දී ඇතත් මෙතෙක් ගෙවීම් කර නොමැති අතර ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 17ක් සඳහා සලසාගෙන තිබුණු රු.29,664,793ක් වූ ප්‍රතිපාදන මුදලින් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන අයවැයගත කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂය තුල වැය දැරීමට අවශ්‍ය නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වූ බව කාරුණිකව දන්වමි. |